**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** **ශිල්ප කලා - I** **කාලය පැය 3 යි**

| නම/ විභාග අංකය: |
|---|

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40 ක් හිමි වේ.
- නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ඊට අදාළ අංකය සපයා ඇති පිළිතුරු පත්‍රයේ කතිරයකින් සටහන් කරන්න.

---

01. ගැමි නැටුම් කලාවට අයත් කළගෙඩි නැටුම් හා ලී කෙළි නැටුම් කලාව අයත් වන ජනකලා වර්ගය වන්නේ,

(1) ශ්‍රව්‍ය කලා (2) දෘශ්‍ය කලා (3) විදග්ධ කලා (4) ශ්‍රව්‍ය දෘශ්‍ය කලා

02. අප අවට පරිසරයේ විවිධ වස්තුවල ජ්‍යාමිතික හැඩතල තිබේ. මල් පෝච්චි, බෝක්කු කැට ආදියේ දැකිය හැකි ජ්‍යාමිතික හැඩතලය වන්නේ,

(1) තල ජ්‍යාමිතිය යි. (2) සංකේත ජ්‍යාමිතිය යි.
(3) ඝන ජ්‍යාමිතිය යි. (4) රේඛා ජ්‍යාමිතිය යි.

03. ජයාමිතික උපකරණ .කට්ටලයේ මිනුම් ලබා ගැනීමට භාවිතා කරන උපකරණය වන්නේ,

(1) කෝණමානය (2) කෝදුව (3) බෙදුම් කටුව (4) කවකටුව

04. පහත වස්තු අතරින් වෘත්තාකාර හැඩය දැකිය හැකි පිළිතුර තෝරන්න.

(1) තේ හැන්ද, කළය, රබාන (2) ක්‍රිකට් පිත්ත, කළය, රබාන
(3) වාහනයක සුක්කානම, රබාන, පෙනේරය (4) කුල්ල, රබාන, පෙනේරය

05. පහත රේඛා වර්ග දෙක භාවිතා වන අවස්ථා නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න.




(1) ඡේදනය කළ යුතු ස්ථාන හා ඡේදනය වන ස්ථාන දැක්වීම සඳහා ය.
(2) සැඟි දුර දැක්වීම හා වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා ය.
(3) ඡේදනය කළ යුතු ස්ථාන හා සැඟි දාර දැක්වීම සඳහා ය.
(4) ඡේදනය වන ස්ථාන හා වස්තුවක පෙනෙන දාර දැක්වීම සඳහා ය.

06. පහත දී ඇති කෝණවල අගයන් නිවැරදිව යෙදී ඇති පිළිතුර තෝරන්න.

A - $135^0$ B - $90^0$ C - $245^0$ D - $180^0$


(1) මහා කෝණ, සරල කෝණ, සෘජු කෝණ, පරාවර්තන කෝණ
(2) පරාවර්තන කෝ, සෘජු කෝණ, මහා කෝණ, සරල කෝණ
(3) මහා කෝණ, පරාවර්තන කෝණ, සෘජු කෝණ, සරල කෝණ
(4) මහා කෝණ, සෘජු කෝණ, පරාවර්තන කෝණ, සරල කෝණ

07. පහත දැක්වෙන නිර්මාණයේ දැකිය හැකි ත්‍රිකෝණ ගණන කීයද?




(1) 34 කි (2) 38 කි
(3) 24 කි (4) 18 කි

8. පහත රූපයේ දැකිය හැකි බහු අස්‍ර නිරමාණ මොනවාද?








(1) ත්‍රිකෝණ හා චතුරස්‍රය යි.
(2) ත්‍රිකෝණ හා පංචාස්‍රය යි.
(3) ත්‍රිකෝණ හා සප්තාස්‍රය යි.
(4) ත්‍රිකෝණ හා ෂඩාශ්‍රය යි.

09. පහත රූපයේ දැක්වෙන්නේ,
(1) ත්‍රිකෝණ ප්‍රිස්මයකි.
(2) පතුල සමචතුරස්‍ර පිරමීඩයකි.
(3) සවිධි චතුරස්‍රයකි.
(4) ඍජු කෝණාස්‍රාකාර පිරමීඩයකි.



10. පහතත දක්වා ඇත්තේ කුමන වස්තු විකසනයක්ද?



(1)  (2)  (3)  (4) 

11. සායම් ආලේපනය සිදු කරනුයේ රෙද්දක තෝරාගත් ප්‍රදේශයක මේ සඳහා සායම් ගැල්වීම සිදු කරනුයේ,
(1) සායම් භාජනයක ගිල්ලවීමය. (2) සායම් මගින් මුද්‍රා තැබීමය.
(3) බාහිර උපකරණයක් මගින් සායම් ගැල්වීමය. (4) මුළු පෙහෙකම් ද්‍රව්‍ය පුරාම වර්ණ පැතිරවීමය.

12. අතීතයේ වර්ණ ලබා ගැනීමට භාවිත කල පාරිසරික සම්පත් අතරින් රතු වර්ණය ලබා ගැනීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය වන්නේ,
(1) රත්මල් වලිනි. (2) සාදිලිංගම් වලිනි.
(3) ගොකටු ගස් කිරි වලිනි. (4) කොස් ලී අරටු වලිනි.

13. රෙදි පිළි අලංකරණයේදී කැඳ ඉවත් කිරීමේ ක්‍රියාවලිය සිදු කරනු ලබන්නේ කුමන හේතුවක් සඳහාද?
(1) සායම් උරා ගැනීමේ පහසුව (2) පෙහෙකම් ද්‍රව්‍යයේ බර අඩු වීම
(3) සේදීමේ පහසුව සඳහා (4) නූල් වලට සිදුවන හානිය වලක්වා ගැනීම

14. රෙදි පි අලංකරණයේදී ඉතා පහසුවෙන් යොදා ගත් පැරණි මුද්‍රණ ක්‍රමයක් ලෙස හඳුන්වන්නේ,
(1) සේද රාමු මුද්‍රණය (2) ස්ටෙන්සිල් මුද්‍රණය
(3) අච්චු මුද්‍රණය (4) සිදුරු තහඩු මුද්‍රණය

15. ස්වභාවික කෙඳි යටතේ හණ, නියඳ, මැනිලා, රැමි යන ශාක වලින් කෙඳි ලබා ගන්නේ කිනම් කොටසකින් ද?
(1) කඳ කොටසින් (2) පත්‍ර වලින් (3) ගෙඩිවලින් (4) මුල්වලින්

16. රෙදි නිෂ්පාදනයේදී කෙඳි වර්ග පරීක්ෂණය මගින් කපු කෙඳිවල ඇති ජලය අවශෝෂණය හැකියාව සිදුවන ප්‍රමාණය වන්නේ,
(1) අඩුයෙන්ය. (2) මධ්‍යස්ථයෙන්ය. (3) වැඩියෙන්ය. (4) අඩු සහ වැඩියෙන්ය.

17. තිර රාමු මුද්‍රණයේ රාමුව සකස් කිරීම සඳහා යොදා ගන්නා සැහැල්ලු ලී වර්ග දෙකක් භාවිත කෙරේ. ඒ මොනවාද?
(1) කදුරු, හල් මිල්ල (2) රුකත් අත්තන, කොහොඹ
(3) කොස්, අඹ (4) රට අඹ, කෙම්පස්

18. රෙදි පිලි අලංකරණයේදී සාරි පල්ලුවක් අලංකාර කිරීමේදී මෝස්තර අලවා ගැනීම සඳහා භාවිතා කරන ගම් වර්ගය වනුයේ,
(1) පැබ්රික් ග්ලූ (2) බයින්ඩර්ගම් (3) කෙම්පික්ස් ගම් (4) සුපර් ග්ලූ

19. ඉංග්‍රිසි ක්‍රමයට අනුව ලිනන් නූල් කැරැල්ලක දිග යාර කීයද?
(1) යාර 840 (2) යාර 560 (3) යාර 300 (4) යාර 800

20. රෙදි විවිවේදී යොදනු ලබන රටාවට අනුව නූල් අදිනු ලබන උපකරණය කුමක්ද?
(1) පුඩුවැල් පේලි මගිනි (2) පනාව මගිනි
(3) අළුව සහ රාමුව මගින් (4) පොරොන්දු රාමුව මගින්

21. හීරි වියමන් අතරින් ඉතා අලකංාර රටාවකි. මෙම රටාව අනුව බර වැඩි රෙදි වර්ග වියාගනි. එම රාටව හඳුන්වන නාමය වන්නේ,
(1) සරල හීරි වියමන ය. (2) රැවිත හීරි වියමන ය.
(3) කඩ හීරි ය. (4) රළ හීරි වියමන ය.

22. ඇලමිනා සිලිකේට් හෙවත් මැටිවල $(Al_2O_3 2SiO_2 2H_2O)$ අඩංගු රසායනික සංයෝග වන්නේ,
(1) ඇලුමිනියම් ඔක්සිජන්, ජලය (2) ජලය, ඔක්සිජන්, කාබන්
(3) ඇලුමිනියම් ඔක්සයිඩ්, සිලිකන්, ජලය (4) ඇලුමිනයම් ඩයොක්සයිඩ්, සිලිකන්, ජලය

23. පහත ලක්ෂණ දැකිය හැකි මැටි වර්ගය වන්නේ,
- නිර්මාණය වූ ස්ථානයේම තැන්පත් වේ.
- පැහැයෙන් සුදු වර්ණයක් ගනී.
- නම්‍යතාවයෙන් අඩුය.

(1) අගම් මැටි ය. (2) පිහිටි මැටි ය. (3) රතු මැටි ය. (4) බෝල මැටි ය.

24. ග්‍රාමීය කර්මාන්තවල මැටි පදනම් කර ගන්නා ප්‍රධාන ක්‍රම වන්නේ,
(1) තෙත හා වියළි මැටි වශයෙන් ය. (2) වියළි මැටි හා බෝල මැටි වශයනේ ය.
(3) වියළි මැටි හා බෝල මැටි වශයෙන් ය. (4) තෙත මැටි හා වාත්තු දියර ලෙස ය.

25. මැටි තහඩු යන්ත්‍රයට ඇතුල් .කළ පසු වාත බුබුළු ඉවත් වී පදනම් වු මැටි රෝලක් වශයෙන් පිටතට ලබාගත හැකි යන්ත්‍රය වන්නේ,
(1) රෝලර් ක්‍රෂර් යන්ත්‍රය. (2) බෝල් මිල් යන්ත්‍රය.
(3) ජෝ ක්‍රෂර් යන්ත්‍රය. (4) පග්මිල් යන්ත්‍රය.

26. යම් මාධ්‍යයක් උපයෝගී කරගෙන ජීවී හෝ අජීවී වස්තුවක් හෝ මනසින් ගොඩනගා ගත් දෙයක් ක්‍රමානුකූලව ගොඩනැගීම හඳුන්වන්නේ,
(1) නෙලීම ලෙසය. (2) මූර්ති ලෙසය. (3) ඇඹීම ලෙසය. (4) ඉදි කිරීම ලෙසය.


27. සමාන ඝනකමකින් යුතු මැටි තහඩු සකස් කිරීම සඳහා භාවිතා කරන යන්ත්‍රය මින් කුමක්ද?
(1) ස්ලැබ් රෝලර් යන්ත්‍රය. (2) ෆිල්ටර් ප්‍රේෂ් යන්ත්‍රය.
(3) පග්මිල් යන්ත්‍රය. (4) ජෝ ක්‍රෂර් යන්ත්‍රය.

28. මෙම රූපයෙන් දැක්වෙන්නේ මැටි පිඩක් පදම් කරගන්නා ආකාරයකි. එම ක්‍රමය හඳුන්වන්නේ,



(1) නිදහස් ඇඹීම
(2) වට්ටක්කා හැඩයට ඇඹීම
(3) ස්පයිරල් ඇඹීම
(4) රෝලර් ඇඹීම

29. මෙම රූප සටහනෙන් දැක්වෙන්නේ පතරොම් භාණ්ඩ නිපදවීමේ එක් පියවරකි. එයනම්,



(1) මැටි පිඩ මධ්‍යගත කිරීම.
(2) මැටි පිඩ විවෘත කිරීම.
(3) බඳුනේ බිත්ති එසවීම.
(4) වයනය ලබා ගැනීමය.

30. භාණ්ඩයක දිග, පළල, සමාන ඝනකම නිසි ප්‍රමිතියෙන් යුක්තව සාදා ගැනීමට සුදුසුම නිෂ්පාදන ක්‍රමය වන්නේ,
(1) කුහර වාත්තු ක්‍රමය (2) ඝන වාත්තු ක්‍රමය (3) අච්චු ක්‍රමය (4) ඇඹීම

31. ශාක පත්‍රයක හැඩයේ අච්චුවක් ලබා ගැනීම සඳහා කළ යුතු සුදුසුම කාර්ය වන්නේ,
(1) ශාක පත්‍රයට ප්ලාස්ටර් ඔප් පැරිස් වත්කර වියලුණු පසු අච්චුව ගලවා වෙන් කර ගැනීම.
(2) සමාන ඝනකමින් යුත් වැඩි තහඩුවක් මත පත්‍රය තබා අවශ්‍ය කොටස් ඉවත් කර ප්ලාස්ටර් පැරිස් ඒ මත වත්කර ගැනීම.
(3) ශාක පත්‍රය ප්ලාස්ටර් පැරිස්වල ගිල්වා ගැනීමෙන්.
(4) ශාක පත්‍රය ප්ලාස්ටර් ඔෆ් පැරිස් තහඩුවක් සාදා එය තද කිරීමෙන්.

32. මැටි භාණ්ඩ කල් පැවැත්ම සඳහාත් ජලය ඉවත් වී ශක්තිමත් භාවය සඳහාත් පිළිස්සීම සිදුකරයි. මෙහිදී මූලික පිලිස්සීම කරනු ලබන්නේ කොපමණ උෂ්ණත්වයක් යටතේද?
(1) සෙල්සියෙස් අංක $100^0$ - $200^0$ (2) සෙල්සියෙස් අංශක $850^0$ - $900^0$
(3) සෙල්සියෙන් අංශක $50^0$ - $100^0$ (4) සෙල්සියෙස් අංශක $900^0$ - $1200^0$

33. උද්‍යාන නිර්මාණයක් කිරීමේදී හැඩතලවලට පරිමාව නියමිත ප්‍රමාණයට යොදා ගැනීම හඳුන් වන්නේ,
(1) අවකාශය යි. (2) සමබරතාවය යි. (3) අනුපාතය යි. (4) සම්පින්ඩනය යි.

34. එළිමහනේ තැබීමට මූර්තියක් සෑදීමට සුදුසු මාධ්‍ය වන්නේ,
(1) සිමෙන්ති (2) මැටි (3) පල්ප/ කඩදාසි (4) ලී/ දැව

35. ගෘහනියන් අපතේ යන වර්ණවත් රෙදි කැබලි මැසීමෙන් ඇලවීමෙන් විවිධ නිර්මාණ කරයි. එසේ කරන නිර්මාණ හඳුන්වන නම කුමක්ද?
(1) ස්ටෙන්සිල් (2) පැච්වර්ක් (3) රිබන් එමබ්‍රොයිඩර් (4) අච්චු මුද්‍රනය

36. රෙදි කැබලි දෙකක් එකට සම්බන්ධකර මැසීමට යොදා ගන්නා මැහුම් ක්‍රමය වන්නේ,
(1) පිස්මේන්තු මැස්ම (2) ලූප් මැස්ම (3) ලේසි ඩේසි මැස්ම (4) ප්‍රංශ ගැටය

37. ළදරුවකු සඳහා තොප්පියන් ගෙතීමේ පියවර ඇතුලත් නිවැරදි පිළිතුර තෝරන්න.
(1) පත්තෑයා ගෙතීම, තනිපට පිරවිලි යෙදීම, තොණ්ඩුව සෑදීම
(2) තොණ්ඩුව සෑදීම, තනිපට පිරවිලි යෙදීම, පත්තෑයා ගෙතීම
(3) දෙපට පිරවිලි යෙදීම, පත්තෑයා ගෙතීම, තනිපට පිරවිලි යෙදීම
(4) තොණ්ඩුව සෑදීම, දම්වැල ගෙතීම, පත්තෑයා ගෙතීම

38. රෙදි කැබලි ආශ්‍රයෙන් පෙන්ගුවින් නිර්මාණය කිරීමේ ක්‍රියාවලිය ඇතුලත් නිවැරදි පිලිතුර තෝරන්න.
A - පතරොම කැමති ප්‍රමාණයකට විශාල කර ගැනීම
B - පතරොම කපා ගැනීම
C - පතරොම රෙද්දේ තබා ඇඳ ගැනීම
D - රෙදි කොටස් කපා ගැනීම
(1) A, B, C, D (2) B, A, C, D (3) C, D, B, A (4) D, C, A, B

39. පේපර් ක්විලින් නිර්මාණය කිරීමේදී පහත සඳහන් උපකරණය භාවිතා කරන්නේ කුමක් සඳහාද?



(1) කඩදාසි පටි රෝල් කර ගැනීමට
(2) රෝල් කරගත් පටි හැඩ ගැන්වීමට
(3) අවශ්‍ය ප්‍රමාණයට ලිහිල් කිරීමට
(4) කඩදාසි කපා ගැනීම සඳහා

40. ස්වභාවික මල් රඳවා ගැනීම සඳහා භාවිතා කරනු ලබන්නේ,
(1) ඩ්‍රයි පෝම් (2) වෙට් පෝම් (3) ඍජු පෝම් (4) කඩදාසි

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# දෙවන වාර පරීක්ෂණය 2018

**11 ශ්‍රේණිය** | **ශිල්ප කලා - II** | **කාලය පැය 2 යි**

නම/ විභාග අංකයඃ

- පළමු ප්‍රශ්නය අනිවාර්යය වන අතර තවත් ප්‍රශ්න හතරක් තෝරාගෙන ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.

(01) ''ශිල්ප නවෝදා'' අධ්‍යාපන ප්‍රදර්ශනය හා නිර්මාණ තරඟාවලිය පසුගිය මාර්තු මස 12 හා 13 යන දෙදින වයඹ පළාත් සභා මහගෙදර පරිශ්‍රයේදී පැවැත්විය. මේ සඳහා පාසල් සිසුන්ගේ අත්කම් නිර්මාණ මෙන්ම ශිල්ප සභාව මගින් මෙහෙයවන පාඨමාලා හදාරණ සිසුන්ගේ නිර්මාණ රාශියක් දක්නට ලැබුණි.

i. ඉවතලන දේශිය අමුද්‍රව්‍ය යොදා ගෙන කළ නිර්මාණ 02 ක් නම් කරන්න.

ii. උත්සවයේ ආරම්භක දින දැල්වූ පොල්තෙල් පහන ස්වභාවික ද්‍රව්‍ය වලින් කර තිබුණි. එවැනි දේශිය අමුද්‍රව්‍ය යොදා නිර්මාණය කළ හැකි පොල්තෙල් පහනක ආකෘතියක් ඇඳ දක්වන්න.

iii. මෙහි මැටි භාණ්ඩ අංශය ප්‍රධාන කොටස් ලෙස වෙන්කර තිබුණි. එහි කැටයම් කැපීම මගින් අලංකාර කළ භාණ්ඩ ද විය. එවැනි කැටයම් කැපූ භාණ්ඩ 02 ක් ඇඳ දක්වන්න.

iv. ප්‍රදර්ශනය සඳහා ඉදිරිපත් කර තිබූ පාරම්පරික කර්මාන්ත ආශ්‍රිත නිමි භාණ්ඩ 04 ක් ලියන්න.

v. කඩදාසි ආශ්‍රිතව විවිධ නිර්මාණ මෙහි දක්නට ලැබුණි.

vi. විවිධ රටා වර්ග යොදා ගනිමින් කළ අත්කම් රෙදිපිළි කාගෙත් නෙත ගැටුණි. සාරි, සරොම්, තුවා වියා ගැනීමට යොදා ගන්නා වියමන් රටාවක මතුපිට පෙනුම ඇඳ රටාව නම් කරන්න.

vii. තරඟයේ ජයග්‍රාහකයින්ට ත්‍යාග පිරිනැමීම සඳහා පෙට්ටියක් නිර්මාණයකර තිබුණි. එහි මුහුණතක පෙනුම ඍජුකෝණාස්‍රාකාරය. එහි විකසනය අඳින්න.

viii. තරඟයේ ජයග්‍රාහකයින්ට පිරිනැමීමට සුදුසු ජය සංකේතයක ආකෘතියක් ඇඳ දක්වන්න.

ix. උත්සව අවස්ථාවට පැමිණි ප්‍රධාන ආරාධිත අමුත්තන් පිළිගැනීම සඳහා මල් කලඹක් හා මල් මාලයක් සකස් කර තිබුණි. එහි ආකෘතියක් ඇඳ දක්වන්න.

x. 2019 වර්ෂයේ ප්‍රදර්ශනය හා තරඟාවලිය සඳහා සුදුසු තේමා පාඨයක් ලියන්න.


(ලකුණු 2x10=20)

(02) ජ්‍යාමිතික නිර්මාණ කිරීම ශිල්ප කලා විෂයට බෙහෙවින්ම වැදගත්ය.

i. වෘත්ත ආශ්‍රිත නිර්මාණ කිරීමේදී භාවිත කරන මාධ්‍ය 04 ක් ලියන්න. (ල.02)

ii. ඔබ කැමති සවිධි බහුඅස්‍රයක් මගින් කළ හැකි මෝස්තර රටාවක් අඳින්න. (ල.04)

iii. පහත දැක්වෙන රූපයේ විකසනය අඳින්න. (ල.04)



(03) රෙදි පිළි අලංකර්ණය වර්තමානයේ ඉතා ජනප්‍රිය කලාවක් බවට පත්වී ඇත.

i. රෙදි පිළි අලංකරණය සඳහා යොදා ගන්නා අලංකරණ ක්‍රම 04 ක් ලියන්න. (ල.02)

ii. අලංකරණය සඳහා යොදා ගන්නා පින්සල් වර්ග නම් කර ඒවායේ අංක ලියන්න. (ල.04)

iii. ඔබ කැමති ක්‍රමයකට කොට්ට උරයක් අලංකාර කර ගන්නා ආකාරය පියවර වශයෙන් ලියන්න. මෝස්තරයක් අඳින්න. (ල.04)

(04) පහත දැක්වෙන්නේ කමිස රෙදි සකස් කරන ලද නූල් හැදයකි.

හැඳයේ දිග මීටර් 100

හැඳයේ පලල සෙ.මී. 40

දික් නූල් සෙ.මී. නුල් පොටවල් - 20

නූලේ නොම්බරය $\frac{2\ S}{40}$

නූලේ වර්ණය - සුදු

i. ඔබ කැමති හීරි වියමනක මතුපිට පෙනුම ඇඳ දක්වන්න. (ල.02)

ii. හැඳයට අවශය දික් නූල් සංඛ්‍යාව සොයන්න. (ල.04)

iii. හැඳයට අවශය නූල් ප්‍රමාණයේ බර සොයන්න. (ල.04)

(05) උත්සව අවස්ථා සඳහා ස්වභාවික මල් මෙන්ම කෘත්‍රිම මල්ද යොදා ගනී.

i. මල් කළඹක් සකස් කිරීමට යොදා ගන්නා ස්වභාවික මල් වර්ග 04 ක් නම් කරන්න. (ල.02)

ii. ස්වභාවික මල් කල්තබාගත හැකි ක්‍රම 04 ක් ලියන්න. (ල.04)

iii. මල් කළඹ නිර්මාණය කිරීමට නිර්මාණකරුවන් යොදා ගන්නා හැඩ 04 ක් ඇඳ නම් කරන්න. (ල.04)

(06) මැටි භාණ්ඩ විවිධ ක්‍රම මගින් අලංකාර කරයි.

i. මැටි භාණ්ඩ අලංකාර කර ගන්නා ක්‍රම 03 ක් නම් කරන්න. (ල.02)

ii. ඉන් එක් ක්‍රමයකට මැටි භාණ්ඩයක් අලංකාරකර ගන්නා ආකාරය පියවර ලෙස ලියන්න. (ල.04)

iii. ප්ලාස්ටර් ඔෆ් පැරිස් මිශ්‍රණය යොදා ගෙන සරල අච්චුවක් සාදාගන්නා ආකාරය පියවර ලෙස ලියන්න. (ල.04)

(07) මැටිවල සංයුතිය අනුව මැටි වර්ග කෙරේ.

i. ද්විතියික මැටි පවර්ග 03 ක් නම් කරන්න. (ල.02)

ii. මැටි භාණ්ඩ නිෂ්පාදනයට යොදා ගන්නා නො ඇලෙන සුළු අමුද්‍රව්‍ය නම් කරන්න. (ල.04)

iii. මැටි පදම් කිරීමේ ග්‍රාමීය තාක්ෂණය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල.04)

**පිළිතුරු පත්‍රය - I කොටස**

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (4 ) | 02. (3 ) | 03. ( 2) | 04. (3 ) | 05. ( 1 ) | 06. ( 4 ) | 07. ( 2 ) | 08. ( 4 ) | 09. ( 1 ) | 10. ( 1 ) |
| 11. (3 ) | 12. (2 ) | 13. ( 1) | 14. (3 ) | 15. ( 1 ) | 16. ( 3 ) | 17. ( 4 ) | 18. ( 1 ) | 19. ( 2 ) | 20. ( 1 ) |
| 21. (2 ) | 22. (3 ) | 23. ( 2) | 24. ( 1 ) | 25. ( 4 ) | 26. ( 3 ) | 27. ( 1 ) | 28. ( 3 ) | 29. ( 4 ) | 30. ( 2 ) |
| 31. (2 ) | 32. (2 ) | 33. ( 3) | 34. ( 1 ) | 35. ( 2 ) | 36. ( 1 ) | 37. ( 4 ) | 38. ( 1 ) | 39. ( 3 ) | 40. ( 2 ) |

**II පත්‍රය**

(01) i. රෙදි කැබලි ආශ්‍රිත - පාපිසි, තසුරතල් සතුන්, බෝනික්කන්
ඉදි කොළ ආශ්‍රිත - තොප්පි, වට්ටි, පෙට්ටි

ii. ඇඳ ඇති නිර්මාණය අනුව ලකුණු ලබා දෙන්න.

iii. සුදුසු රූප සටහන් දෙකක් ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න.

iv. * වට්ටි, පෙට්ටි, පන්, පැදුරු
* වේවැල් කූඩ, පුටු
* අත්කම් රෙදිපිළි, මැටි භාණ්ඩ

v. බිත්ති සැරසිලි, ආභරණ කට්ටල, මල් පොකුරු, විසිතුරු බඳුන්, මූර්ති

vi. සුදුසු වියමන් රටාවක් සඳහා ලකුණු ලබාදෙන්න

vii. අදාල රූප සටහන් ද ඇඳ ඇත්නම් ලකුණු ලබා දෙන්න

viii. නිවැරදිව විකසනය ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න

ix. ඇඳ ඇති මල් කළඹේ ආකෘතිය සඳහා ලකුණු ලබාදෙන්න

x. සුදුසු තේමා පාඨයක් සඳහා ලකුණු ලබාදෙන්න (ලකුණු 02 × 10 = 20)

(02) i. කඩදාසි, රෙදි, ඉටි රෙදි, වේවැල්, පොල් කොළ, ගොක් කොළ, හණ ආදිය

ii. සුදුසු මෝස්තර රටාවකට ලකුණු ලබා දෙන්න

iii. නිවැරදිව විකසනය ඇඳ ඇත්නම් ලකුණු ලබාදෙන්න

(03) i. ස්ටෙන්සිල් මුද්‍රණය, අච්චු මුද්‍රණය, අතින් පින්තාරු කිරීම, තාපබන්ධින ක්‍රමය ආදිය

ii. රවුම් පින්සල් නො. 4 - 9 සියුම් නිමා පින්සල් නො 00.03
පැතලි පින්සල් -1/2 cm සිට 2cm දක්වා විශාල සේදුම් පින්සල්

iii. සුදුසු මෝස්තරයක් ඇඳ පියවර වශයෙන් විස්තර කර තිබේ නම් ලකුණු ලබා දෙන්න.

(04) i. හීරි වියමනක මතුපිට පෙනුම ඇඳ තිබේ නම් ලකුණු ලබා දෙන්න.

ii. හැදයේ පළල x 1cm ඇති දික් නූල් ගණන

$20 \times 40 = \underline{800}$

iii. අවශ්‍ය නූල් ප්‍රමාණයේ බර $= \dfrac{100 \times 40 \times 20 \times 2}{100 \times 40}$

$= 4\,kg$

(05) i. රෝස මල්, ඇන්තූරියම් මල්, නෙළුම් මල්, අරලිය මල් ආදිය

ii. සබන් මිශ්‍ර ජල යොදා ගැනීම
ඇස්ප්‍රීන් මිශ්‍ර ජලය යෙදීම
වායු සමීකරණ කළ කාමරවල තිබීම
මල් සහ කොළ ඉතිවල නටුවේ ජලයෙන් පොඟවා ගත් තෙත පුළුන් ඔතා ගැනීම
මල් ඉති ජලයට දමා ජලය තුළ දී නටුවෙන් කපා ගැනීම

**පිළිතුරු පත්‍රය - ඉතිරි කොටස**

iii. දිගටි හැඩය
අශ්ව ලාඩමක හැඩය
පෝසි හැඩය
අයිඩ්‍රොප් හැඩය
හදවත් හැඩය
ආම්ස්ට්‍රේ හැඩය

(06) i. පින්තාරු කිරීම, සායම් ඉසීම, සායම් වක් කිරීම, වර්ණ පිඹීම, සායම් තුළ ගිල්ලවීම, කොලාජ් නිර්මාණ, ඩෙකෝපාපර් නිර්මාණ, පල්ප් නිර්මාණ ආදිය

ii. පියවර වශයෙන් එක් ක්‍රමයක් ලියා තිබේ නම් ලකුණු දෙන්න.

iii. සරල අච්චුවක් සාදා ගන්නා ආකාරය තිබේ නම් ලකුණු දෙන්න

(07) i. රතු මැටි, ගිනි මැටි, බෝල මැටි, කළු මැටි, මකුළු මැටි, තලප මැටි

ii. ෆෙල්ස්පාර්, ක්වාට්ස්, සිලිකා වැලි, ඩොලමයිට්, ග්‍රොග්

iii. මැටි පදම් කර ගන්නා ආකාරය නිවැරදිව තිබේ නම් ලකුණු ලබා දෙන්න.